# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2261/3 - 2022 ජනවාරි මස 03 වැනි සඳුදා - 2022.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි වගන්තිය යටතේ කරනු ලබන නියමය

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ලලිත් යූ. ගමගේ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි වගන්තිය යටතේ සඳහන් විධිවිධාන මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් නියමයන් මෙයින් දන්වා සිටිමි.

**නීතිඥ ලලිත් යූ ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2021 දෙසැම්බර් මස 31 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
මාළිගා චතුරශ්‍රය,
මහනුවර දී ය.

**නියමය**

1. මෙම නියමය මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවන් හි 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛන බලාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නියමය වශයෙන් හැඳින්වේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. මධ්‍යම පළාතට අයත් හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 වන වගන්තිය ප්‍රකාරව සකස්කොට, ප්‍රාදේශීය සභා පනතේ 168 (2) වගන්තිය යටතේ අවසාන වශයෙන් සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කරනු ලැබ, එය සම්මත කරනු නොලැබීම හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2021.12.31 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට සභාපති ධුරය අතහැර ගියා සේ සලකා එදින සිට බලපැවැත්වෙන පරිදි හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වූවා සේ සැලකිය යුතුය.

3. මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් සීමාව තුළ පිහිටි හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදළ අයවැය වාර්තාව ප්‍රාදේශීය සභා පනතේ 168, 168(2) වගන්තිවල අවශ්‍යතා අනුව සම්මත කිරීමට අපොහොසත් වීම හේතුවෙන් හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ තනතුර 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වන වගන්තිය අනුව පුරප්පාඩු වන බැවින් 2012 අංක 22 වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතට අනුව එම පුරප්පාඩුව පිරවෙන තෙක් සභාපතිවරයාගේ තනතුර පුරප්පාඩු වූ දින සිට එම තනතුරේ බලතල, කටයුතු, කාර්යය, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 8(4) වගන්තිය ප්‍රකාරව උප සභාපතිවරයා වෙත පැවරෙන බව මෙයින් දැනුම් දෙමි.

4. මධ්‍යම පළාත තුළ යම් ප්‍රාදේශීය සභාවක් සඳහා 2022 වර්ෂයට අදාළ අයවැය ලේඛනයක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සම්මත නොවුණු කල්හි හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතෙහි 17 වැනි වගන්තිය ප්‍රකාරව අදළ ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති විටක දී, එම පුරප්පාඩු සභාපති ධුරය පිරවීම සඳහා 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතෙහි විධිවිධාන අනුව කටයුතු කර නොමැති විටක දී හෝ එසේ, පුරප්පාඩු වී ඇති ධුරය සඳහා පත්වූ සභාපතිවරයෙකුට 2022 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සම්මත කර ගැනීමට අදළ වූ යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමට ඊට අදාළ ලිඛිත නීතියට අනුකූලව විය යුතු අවම දින ප්‍රමාණය ඉතිරි නොවුණු අවස්ථාවක අදළ ප්‍රාදේශීය සභාව වෙත 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද යම් අයවැය ලේඛනයක් අදාළ ප්‍රාදේශීය සභාව පිහිටි දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය යටතේ එකී ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේය.

5. මෙම නියමයන් හි සඳහන් සියලු විධිවිධානයන් 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානයන්ට සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතෙහි විධිවිධානයන්ට යටත්ව ක්‍රියාත්මක වන්නේය.

EOG 01 - 0002/1

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා අඥාපනතේ 247 වැනි වගන්තිය යටතේ වූ නියමය

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ලලිත් යූ. ගමගේ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 247 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පහත සඳහන් නියමය මෙයින් නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2021 දෙසැම්බර් මස 31 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
මාළිගා චතුරශ්‍රය,
මහනුවර දී ය.

**නියමය**

1. මෙම නියමය මධ්‍යම පළාතේ නගර සභාවන් හි 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛන බලාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නියමය වශයෙන් හැඳින්වේ.

2. මධ්‍යම පළාත තුළ යම් නගර සභාවක් සඳහා 2022 වර්ෂයට අදාළ අයවැය ලේඛනයක් 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 178 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සම්මත නොවුණු කල්හි හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව අදාළ නගර සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති විටක දී, එම පුරප්පාඩු සභාපති ධුරය පිරවීම සඳහා 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතෙහි විධිවිධාන අනුව කටයුතු කර නොමැති විටක දී හෝ එසේ පුරප්පාඩු වූ ධුරය සඳහා පත්වූ සභාපතිවරයෙකුට 2022 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සම්මත කර ගැනීමට අදාළ වූ යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමට ඊට අදළ ලිඛිත නීතියට අනුකූලව විය යුතු අවම දින ප්‍රමාණය ඉතිරි නොවුණු අවස්ථාවක අදළ නගර සභාව වෙත 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද යම් අයවැය ලේඛනයක් අදාළ නගර සභාව පිහිටි දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය යටතේ එකී නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේය.

3. මෙම නියමයෙහි සඳහන් සියලු විධිවිධානයන් 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානයන්ට සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතෙහි විධිවිධානයන්ට යටත්ව ක්‍රියාත්මක වන්නේය.

EOG 01 - 0002/2

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි වගන්තිය යටතේ වූ නියමය

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ලලිත් යූ. ගමගේ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පහත සඳහන් නියමය මෙයින් නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2021 දෙසැම්බර් මස 31 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
මාළිගා චතුරශ්‍රය,
මහනුවර දී ය.

**නියමය**

1. මෙම නියමය මධයම පළාතේ ප්‍රාදේශීය සභාවන්හි 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛන බලාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නියමය වශයෙන් හැඳින්වේ.

2. මධ්‍යම පළාත තුළ යම් ප්‍රාදේශීය සභාවක් සඳහා 2022 වර්ෂයට අදළ අයවැය ලේඛනයක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සම්මත නොවුණු කල්හි හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතෙහි 17 වන වගන්තිය ප්‍රකාරව අදළ ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති විටක දී, එම පුරප්පාඩු සභාපති ධුරය පිරවීම සඳහා 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතෙහි විධිවිධාන අනුව කටයුතු කර නොමැති විටක දී හෝ එසේ පුරප්පාඩු වී ඇති ධුරය සඳහා පත්වූ සභාපතිවරයෙකුට 2022 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සම්මත කර ගැනීමට අදළ වූ යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමට ඊට අදළ ලිඛිත නීතියට අනුකූලව විය යුතු අවම දින ප්‍රමාණය ඉතිරි නොවුණු අවස්ථාවක අදළ ප්‍රාදේශීය සභාව වෙත 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද යම් අයවැය ලේඛනයක් අදළ ප්‍රාදේශීය සභාව පිහිටි දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය යටතේ එකී ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේය.

3. මෙම නියමයෙහි සඳහන් සියලු විධිවිධානයන් 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානයන්ට සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතෙහි විධිවිධානයන්ට යටත්ව ක්‍රියාත්මක වන්නේය.

EOG 01 - 0002/3

## මධ්‍යම පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි වගන්තිය යටතේ කරනු ලබන නියමය

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ලලිත් යූ. ගමගේ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වැනි වගන්තිය යටතේ සඳහන් විධිවිධාන මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් නියමයන් මෙයින් දන්වා සිටිමි.

**නීතීඥ ලලිත් යූ ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2021 දෙසැම්බර් මස 31 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
මාළිගා චතුරශ්‍රය,
මහනුවර දී ය.

**නියමය**

1. මෙම නියමය මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභාවන් හි 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛන බලාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නියමය වශයෙන් හැඳින්වේ.

2. මධ්‍යම පළාතට අයත් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 වන වගන්තිය ප්‍රකාරව සකස් කොට, ප්‍රාදේශීය සභා පනතේ 168 (2) වගන්තිය යටතේ අවසාන වශයෙන් සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කරනු ලැබ, එය සම්මත කරනු නොලැබීම හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2021.12.31 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට සභාපති ධුරය අතහැර ගියා සේ සලකා එදින සිට බලපැවැත්වෙන පරිදි මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වූවා සේ සැලකිය යුතුය.

3. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයට අයත් සීමාව තුළ පිහිටි මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදළ අයවැය වාර්තාව ප්‍රාදේශීය සභා පනතේ 168, 168(2) වගන්තිවල අවශ්‍යතා අනුව සම්මත කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ තනතුර 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වන වගන්තිය අනුව පුරප්පාඩු වන බැවින් 2012 අංක 22 වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතට අනුව එම පුරප්පාඩුව පිරවෙන තෙක් සභාපතිවරයාගේ තනතුර පුරප්පාඩු වූ දින සිට එම තනතුරේ බලතල, කටයුතු, කාර්යය, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 8(4) වගන්තිය ප්‍රකාරව උපසභාපතිවරයා වෙත පැවරෙන බව මෙයින් දනුම් දෙමි.

4. මධ්‍යම පළාත තුළ යම් ප්‍රාදේශීය සභාවක් සඳහා 2022 වර්ෂයට අදළ අයවැය ලේඛනයක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සම්මත නොවුණු කල්හි හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතෙහි 17 වැනි වගන්තිය ප්‍රකාරව අදළ ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරවප්පාඩු වී ඇති විටක දී, එම පුරප්පාඩු සභාපති ධුරය පිරවීම සඳහා 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතෙහි විවිධාන අනුව කටයුතු කර නොමැති විටක දී හෝ එසේ, පුරප්පාඩු වී ඇති ධුරය සඳහා පත්වූ සභාපතිවරයෙකුට 2022 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සම්මත කර ගැනීමට අදළ වූ යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමට ඊට අදළ ලිඛිත නීතියට අනුකූලව විය යුතු අවම දින ප්‍රමාණය ඉතිරි නොවුණු අවස්ථාවක අදළ ප්‍රාදේශීය සභාව වෙත 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද යම් අයවැය ලේඛනයක් අදළ ප්‍රාදේශීය සභාව පිහිටි දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය යටතේ එකී ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේය.

5. මෙම නියම හි සඳහන් සියලු විධිවිධානයන් 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානයන්ට සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතෙහි විධිවිධානයන්ට යටත්ව ක්‍රියාත්මක වන්නේය.

EOG 01 - 0002/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.